සන්නස
SANNASA

# මියුරු සර ගී සරණිය 2019

## අති සාර්ථක ප්‍රසංගයක් පිළිබඳ සටහනක්

ජගත් ජේ එදිරිසිංහ

මව්බිමෙන් බැහැරව ගෙවන දිවිය කටුක ය. හැමවිටෙකම විඳින්නේ වචන වලින් කියාගන්නට බැරි යම් කිසි හුදකලාවකි. ඒ හුදකලාව තේරුම් ගන්නට නම් ඒ අත්දැකීම විඳින්නටම සිදුවෙයි. අනෙක් අතින් කෙළවරක් නැති, විවේකයක් නැති ජීවන සටන ය. නිවාඩුවක් නැති ගමනකි.
මෙවන් පරිසරයක් තුළ කොටුවුණ අය සැනසීමක් සොයා, සැහැල්ලුවක් සොයා විවිධ ඉසව් කරා ඇදී යමින් සිටින සැටි අපි දකිමු. සංගීතයද එවන් එක් ඉසව්වක් බවට පත්ව ඇති සැටි අපට පෙනෙයි.



සංගීතය මනසට ඔසුවකි. සිත නිවන භාවනාවකි. සිත් තැවුල් සො දුක් ඈතින් ඈතට පළවා හරින මදනළකි. ඒ සුවය පතා වික්ටෝරියාවේ බොහෝ ප්‍රදේශ වල සංගීත කව ආරම්භ වී තිබීම සතුටට කරුණකි.

මියුරුසර සංගීත කවය ආරම්භවන්නේ ඩඩ්ලි විමලතිස්ස ගේ අදහසක් අනුව ය. ඒ පිළිබඳව විශේෂ ස්තුතියක් ඔහුට හිමි විය යුතු ය. ඔහු වටා එක් රොත් වුණ ශ්‍රී ලාංකිකයන් බොහෝ ගණනකි. ඒ සියලු දෙනාම සතියකට දෙකකට හෝ මසකට වරක් එක් රැස් වී ලී ගයති. මේ ගායනා තුළ ඇත්තේ වෘත්තිය ගායක ගායිකාවන් වීමේ අරමුණ නොවේ. ඇහි ඇත්තේ හුදෙක් තම තමන්ගේ හැකියා බෙදා හදා ගැනීමේ අගය කිරීමේ සහ සතුටක් ලැබීමේ අරමුණ පමණකි. මියුරු සර ගී ප්‍රසංගය මේ ගමනේ එක් අතුරු ඵලයකි.





මියුරු සර 2019 ප්‍රසංගය පසුගිය ඔක්තෝබර් 26 වන දා පැවැත්වුණේ ගායක ගායිකාවන් තිස් දෙනෙකුගේ ගී ගායනා සමගින් ය. ප්‍රේම් යාපා, බුද්ධිම මාපා, නන්දසිරි ද සිල්වා, ලලිතා විමලතිස්ස, ඩඩ්ලි විමලතිස්ස, ෂර්ලි තාබෲ, අමිල රඹුක්කන, ජේඑම්ජී ප්‍රනාන්දු, අනුරුද්ධ පෑබෝවිට, කාංචනා විජේසේන, චතුරි පියදාස, සංජය පීරිස්, ප්‍රියන්ත සහ තුෂාර ලියනගේ, ගාමිණී නාරම්පනාව, කාව්‍යා ද සිල්වා, සුදාර ද සිල්වා, නෙතකි සමගින් චානක රූපසිංහ, එල්මෝ ප්‍රනාන්දු, ගාමිණී ජයසිංහ, ස්වර්ණා බන්නැහැක සමගින් සංජය, සවිඳු කපුහැන්දිහේවා,





20 වන පිටට

